# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

## පුරප්පාඩු නිවේදනය

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙරට බහුවිධ යටිතල පහසුකම් නියාමන ආයතනය වශයෙන් ස්ථාපිත කර ඇත. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සම්මත කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව විදුලිබල කර්මාන්තයේ ආර්ථික, ආරක්ෂණ හා තාක්ෂණ නියාමන ආයතනය වශයෙන් ක්‍රියාත්මක වේ.

### අධ්‍යක්ෂ
### (පාරිසරික, බලශක්ති සංරක්ෂණ හා පුනර්ජනනය)

වාර්තාකරණ සම්බන්ධතාවය:

- වාර්තාකරණ සම්බන්ධතාවය- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (කර්මාන්ත සේවා)

සුදුසුකම් සහ පළපුරුද්ද

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විදුලි ඉංජිනේරු උපාධිය සහ
- අදාළ විෂය ක්ෂේත්‍රයෙන් ලබාගත් ශාස්ත්‍රපති උපාධිය (Masters Degree) / වරලත් ඉංජිනේරුවරයෙකු වීම සහ
- විදුලි කර්මාන්තය තුළ අවම වශයෙන් අවුරුදු 15ක පසු සේවා පළපුරුද්ද (ප්‍රථම උපාධිය ලබා ගත් පසු) හෝ උපයෝගිතා ක්ෂේත්‍රයේ නියාමනය පිළිබඳ අවුරුදු 12ක සේවා පළපුරුද්ද
- වයස: අවුරුදු 50 ට නොවැඩි විය යුතුය

### අධ්‍යක්ෂ
### (මානව සම්පත් හා පරිපාලන)

වාර්තාකරණ සම්බන්ධතාවය:

- වාර්තාකරණ සම්බන්ධතාවය- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්)

සුදුසුකම් සහ පළපුරුද්ද

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කළමනාකරණය/ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ වෙනත් සමාන වෘත්තීය සුදුසුකමක් සහ
- අදාළ විෂය ක්ෂේත්‍රයෙන් ලබාගත් පශ්චාත් උපාධිය සහ
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර 15ක සුදුසුකම් ලබාගත් පසු සේවා පළපුරුද්ද (ප්‍රථම උපාධිය ලබා ගත් පසු)
- වයස: අවුරුදු 50 ට නොවැඩි විය යුතුය

### නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)

වාර්තාකරණ සම්බන්ධතාවය:

- වාර්තාකරණ සම්බන්ධතාවය- අධ්‍යක්ෂ ජනරාල්

සුදුසුකම් සහ පළපුරුද්ද

- විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් ලබා තිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම සහ
- සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙහිම බලපත්‍ර සහිත ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වීම සහ
- නඩු කටයුතු, ආයතනික නීති, ගිවිසුම් නීතිය හා ආරවුල් නිරාකරණය ඇතුලත්ව නීති ක්ෂේත්‍රයේ සියලු කටයුතු පිළිබඳ අවම වසර 10ක සේවා පළපුරුද්ද හෝ උපයෝගිතා ක්ෂේත්‍රයේ නියාමනය පිළිබඳ වසර 08ක සේවා පළපුරුද්ද
- පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීති පශ්චාත් උපාධියක් (LLM) ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

වයස: අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

<u>පොදු කොන්දේසි</u>

- ඉහත තනතුරු සඳහා ආකර්ෂණීය වැටුප් හා ප්‍රතිලාභ හිමි වේ.
- සුදුසුකම් සහ පළපුරුද්ද අනුව තෝරාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය/ තරඟ විභාගයක් සඳහා කැඳවන අතර එම තෝරාගැනීමේ පරීක්ෂණ වලට ලබාගන්නා ලකුණු පදනම් කරගෙන තෝරාගැනීම සිදු කෙරේ
- අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකතන අංක, උපන් දිනය, වයස, පුරවැසිභාවය, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ වෙනත් තොරතුරු සහ අයදුම්කරු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකතන අංක ඇතුලත් කර සකසන ලද අයදුම්පත් 04.09.2025 වැනි දින හෝ එදිනට පෙර එවිය යුතු වේ.
- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහල කොටසේ හෝ ඊමේල් පණිවිඩයේ විෂය තීරයෙහි අයදුම්කරන තනතුර සඳහන් කල යුතු ය

ලිපිනය:
වැ.බ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
6 වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ,
28, ශාන්ත මයිකල් පාර,
කොළඹ - 03.

විද්‍යුත් තැපැල: careers@pucsl.gov.lk
දුරකතනය: 011-2392608/7
වෙබ්අඩවිය: www.pucsl.gov.lk

සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

21.08.2025